# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1779/37 - 2012 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2012.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

32, 33 සහ 34 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32, 33 සහ 34 වැනි වගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දැල්පන්දු ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයේ නිලවරණයක් පවත්වන තෙක් තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් 2011.06.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 2011.08.19 වැනි දින අංක 1719/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද තැනැත්තන්ගේ පත් කිරීම 2012.10.01 වැනි දින සිට අවලංගු කරමි.

එම දැල්පන්දු සම්මේලනයේ කටයුතු නිලවරණයක් පවත්වන තෙක් තවදුරටත් පවත්වාගෙන යාමට නැවත දැනුම්දෙන තුරු තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් පත්කළ තැනැත්තන්ගේ නාමලේඛනය 2012.10.02 වැනි දින සිට පහත සඳහන් පරිදි බැව් මෙයින් දන්වා සිටිමි.

එන්. කේ. අබේසිංහ මහතා - සභාපති
ආර්. වයි. ඒ. සීතාරමණී මිය - ලේකම්
ලක්ෂ්මි වික්ටෝරියා මිය - සාමාජික
ලක්ෂ්මි සමරසිංහ මිය - සාමාජික

මහින්දානන්ද අලුත්ගමගේ,
ක්‍රීඩා අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

10 - 1192

1A - G 16753— 331 (2012/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.